# පින සහ කුසලය
# පිළිබඳ
# ථෙරවාදය

ආතාපී

# "පින" සහ "කුසලය"

# පිළිබඳ

# ථෙරවාදය

© හිමිකම් ප්‍රකාශනය

“ යං කිඤ්චි සුභාසිතං සබ්බං තං තස්ස භගවතො වචනං
අරහතො සම්මාසම්බුද්ධස්ස ”

“යම්කිසි සුභාෂිතයක් ඇත් ද
එසැම භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ය”

සම්පාදනය
සමින්ද රණසිංහ

www.aathaapi.org

# කො නු හාසො කිමානන්දො, නිච්චං පජ්ජලිතෙ සති
# අන්ධකාරෙන ඕනද්ධා, පදීපං න ගවෙස්සථ

ධම්මපදය 146
11 වෙනි ජරාවග්ගය - 1

නිතර රාගාදී එකොළොස් ගින්නකින් දැවෙන්නා වූ ( ලෝ වැසියනි, තොපට ) කුමන සිනහවක් ද ? කුමන සතුටක් ද ? ( අවිද්‍යා නැමැති ) මහ අඳුරෙන් වෙළී ඇති කල්හි, පහන ( ආලෝකය ) නො සොයවු ද ?

රාගාදී එකොළොස් ගින්නකින් ගිනිගෙන දිලිසෙන්නා වූ ලෝ වැසියෝ ඉතා කුඩා ආශ්වාදයක් ලැබ සිනහ වෙත්, සතුටු වෙත්. අපගේ ජීවිත මහ ගිනි ගොඩකින් දැවෙමින් පවතී. නමුත් මෝහ නැමැති අඳුරෙන් වෙළී සිටින අපට එය ඉතා සාමකාමී ලෙස, සන්සුන් ලෙස ගෙවෙන බවක් හැඟේ. ඔබ මේ ලෝකයේ සිටින යහපත් මිනිසුන්ගෙන් කෙනෙකු ලෙස ඔබට වැටහෙනු ඇත. ඔබ දරුණු අපරාධ නො කරන්නෙකු ලෙස ද, ඉතා නිරෝගී පුද්ගලයෙකු ලෙස ද, ඥාති මිත්‍රාදීන් සහිත වූ ගේ දොර ඉඩකඩම් යානවාහන සහිත වූ ධාර්මික රැකියාවක් සහිත වූ වාසනාවන්ත පුද්ගලයෙකු ලෙස ද ඔබට වැටහෙනු ඇත.

මෙතෙක් කල් ජීවිතය ගත වූ අයුරින් ම හෙට දිනයත් වාසනාව සහිතව සන්සුන් ව සාමකාමී ව ගෙවෙනු ඇතැ යි අපගේ බලාපොරොත්තුව යි. නමුත් ‘හෙට’ නැමැති දිනය ගැන මොහොතක් නුවණින් සිතා බලන්න. මාරයා සමඟ විශේෂ ගිවිසුමක් අපට නැත. මරණය කවදා, කොතැනක, කවර වෙලාවක, කුමන ආකාරයකින් සිදුවේදැ යි අපි නොදනිමු. හෙට ඔබේ ජීවිතයේ අවසන් දිනය වුවහොත් ? ඔබ එයට සූදානම් ද ? ඔබට මුහුණ දිය හැකි වන්නේ

කුමන ආකාරයක මරණයකට ද ? රෝගයකින් මිය යාමකට ද ? රිය අනතුරකින් මිය යාමකට ද ? එසේ නැතහොත් වෙඩි පහරකින් හෝ බෝම්බයකින් මිය යාමකට ද ? සුළි සුළඟකින් සුනාමියකින් භූමි කම්පාවකින් වැනි ස්වභාවික විපතකින් මිය යාමකට ද ? හොඳින් සිතා බලන්න. මරණය සිද්ධ වන මොහොත ඉතා දරුණු වේදනාවක් සහිත බව නුවණැත්තන් විසින් ප්‍රකාශ කර ඇත. ඔබට සිහිය ඇතිව එම මොහොතට මුහුණ දිය හැකිද ? එම දරුණු වේදනා මැද භයක් දුකක් ශෝකයක් ඇති කර නො ගෙන සතර අපායෙහි ඉපදීම වැළැක්වීමට තරම් සිහියකින් ප්‍රඥාවකින් කුසල් සිත් පවත්වා ගත හැකි ද ?

එසේ නැති නම් හෙට ඔබගේ දෑස නොපෙනී ගියහොත්, කන් බිහිරි වුවහොත්, අත පය සෙළවීමට නොහැකි වුවහොත් එය කොයිතරම් වේදනාකාරී අත්දැකීමක් වනු ඇත් ද ? හෙට ඔබගේ ධනයට ( ගින්නෙන් හෝ ජලයෙන් හෝ සොරුන්ගෙන් හෝ ) හානියක් වුවහොත්, ඥාතීන් විපතට පත්වීමෙන් වැලපීමට සිදුවුවහොත් එය කොයිතරම් දුකක්, ශෝකයක් සහිත අත්දැකීමක් වනු ඇත් ද ? සමහරවිට මෙය උවමනාවට වඩා අසුභවාදී ලෙස සිතීමකැයි කෙනෙකුට සිතෙනු ඇත. එය පුදුමයට කරුණක් නො වේ. එය සසර ගැන හෝ ජීවිතය ගැන හෝ වැටහීමක් නො මැති පුද්ගලයාගේ චින්තන රටාව ය. ව්‍යසනයක් පැමිණෙන තෙක් එය ගැන නොසිතා සිටීම, එම ව්‍යසනයට මුහුණ දෙන ආකාරය නොසිතීම පෘථග්ජන ස්වභාවය ය. උදාහරණයක් ලෙස අප දේශයෙහි සුනාමි ව්‍යසනයට පත් වූවන්ගෙන් බොහෝ දෙනෙකු එවැන්නක් තමන්ට සිද්ධ වේ යැයි නො සිතන්නට ඇත. එනමුදු එය සිදුවිය. එය ජීවිතයෙහි ස්වභාවය යි. මෙවර අප එම දුක නො වින්ද ද සසර සැරිසරන්නා වූ

අපට ද එවැනි අත්දැකීම් දහස් ගණනකට මුහුණ දීමට සිදු ව ඇති බව උතුම් වූ බුදුරජාණන් වහන්සේගේ දේශනය යි.

කරුණු මෙසේ ඇති කල්හි ද ඉතා කුඩා ආස්වාදයක් ලැබ සිනහ සීමටත් සතුටු වීමටත් අපි පුරුදු වී ඇත්තෙමු. ඉතා දරුණු දුක්ඛයනට දරුණු ව්‍යසනයනට භාජනය වීමට සිටින අප කුඩා ආස්වාදයක් ලැබ මහත් කොට සිනහසෙයි. සතුටුවෙයි. දුගඳ වූ පිළිකුල් වූ සැරව සහිත වූ වේදනාව සහිත වූ තුවාලයක් ඇති පුද්ගලයෙකු එම තුවාල සීමාව (වණ මුව) නිය පිටින් කැසීමෙන් සියුම් ආස්වාදයක් ලැබීම මේ සඳහා ධර්මයෙහි සංග්‍රහ වන කදිම නිදසුනකි.

ඉහත සඳහන් ව්‍යසනයනට හෙට දිනයෙහි ඔබට මුහුණ දීමට සිදුවුවහොත් එම කාරණයෙන් ද ඔබ වාසනාවන්තයෙකි. ඔබට තව දිනයක් ම ඇති බැවිනි. සත්‍යය නම් එම ව්‍යසනයන් අප කරා අදම පැමිණිය හැකි බව ය.

මෙසා දරුණු අඳුරකින් අප වෙලී ඇති කල්හි ත්, උතුම් වූ මහා කාරුණිකයන් වහන්සේ විසින් අපහට සිතින් ගණනය කර ගත නොහැකි වූ කාලයක් පුරා මහත් වූ වීර්යය සහිත ව මහත් වූ ප්‍රඥාව සහිත ව පාරමී ධර්ම පුරා ස්වකීය පරාක්‍රමයෙන් අවබෝධ කොට අප කෙරෙහි අනුකම්පාවෙන් දේශනා කරන ලද්දා වූ උතුම් වූ ශ්‍රී සද්ධර්මය අවබෝධ කිරීම පිණිස වැයම් නො කරන්නේ මන්ද ?

( ලෝ වැසියෙනි, තෙපි )

කුමක් නිසා මාර්ග ප්‍රඥාව නම් වූ

මහා ආලෝකය ගවේෂණය නො කරත් ද ?

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු
අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස
සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත
වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට
උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ
සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද
සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

# "පින" සහ "කුසලය" පිළිබඳ ථෙරවාදය

අනාදිමත් කාලයක් පුරා සපුරන ලද පාරමී සහිත වූ දශබලධාරී වූ සර්වඥ වූ මහා කාරුණික වූ අප මහා සම්බුදු පියාණන් වහන්සේ විසින් ශ්‍රද්ධා ධනයෙන් ආඪ්‍ය වූ සඨ නො වූ මායා නො වූ ඍජු ජාතික වූ ප්‍රඥාභරණයෙන් ශෝභමාන වූ සාධු ජනයන්ගේ හිත සුව පිණිස දේශනා කරන ලද සර්වාර්ථසාධක වූ විමුක්ති රසයෙන් අනූන වූ නෛර්යාණික ශ්‍රී සද්ධර්ම සාගරය ඇතැමෙකුට ගැඹුර වැඩි නිසා දෝ ඇතැමෙකුට තමන්ගේ නැණ දුබල කරන පෙර කළ පාපයෙහි විපාකය බලවත් වූ නිසා දෝ ඇතැම් තැනෙක ගළපාගත නොහී

අවුලෙන් අවුලට පත් ව තම අවුලෙන් නො නැවතී අන්‍යයන්ද නො මගට යොමු කිරීම හා භව්‍ය ජනයන්ගේ නිවනට පවා බාධා වන පමණට ඔඩුදිවීම සංවේගයට කාරණයය.

තිලෝගුරු බුදුපියාණන් වහන්සේ වැඩ සිටි කල පවා ශ්‍රී සද්ධර්මයෙහි ගැඹුර දරාගත නොහැකි ශ්‍රද්ධා ප්‍රඥා ගුණයෙන් මද පිරිස සිටි බව මජ්ඣිම නිකායෙහි බහුවේදනීය සූත්‍රයෙහි සඳහන් වන උදායි තෙරුන් හා පඤ්චංගික ථපති අතර සංවාදයෙන් පැහැදිලි වේ.

මෙම අවුල් සහගත තත්වයන් අතර "පින" සහ "කුසලය" පිළිබඳ විවිධ මතිමතාන්තර ඉදිරිපත් කිරීම ද දක්නට ලැබිණ. "පින" සහ "කුසලය" අර්ථ වශයෙන් දෙකක්ය යන්න එක් මතයකි. "පින" යනු "කුසලය" හි ලෞකික කොටස බව තව මතයකි. "පින" සහ "කුසලය" අර්ථ වශයෙන් සමාන බව ථෙරවාදය ඇසුරෙන් පැහැදිලි කර, පින් හෝ කුසල් හෝ රැස්කර නිර්වාණාධිගමනය කළ හැකි බව අවබෝධ කර, නිවනට බාධාවක් වන නිර්මල ශ්‍රී සද්ධර්මය පිළිබඳ ඇති සැක දුරුකිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය යි.

මහා කාරුණික වූ අප මහා සම්බුදු පියාණන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධා ගෞරව ඇති කෙනෙකුට පින් කර නිවන ලද හැකි බව එතරම් වෙහෙසවීමකින් තොරව අවබෝධ වන බව අපගේ අදහසයි. අප කෙරෙහි මහා කරුණාවෙන් දේශනා කරන ලද ධජග්ග සූත්‍රයෙහි සංඝ ගුණ අතර මහා සුගතයන් වහන්සේ **"අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස"** *( සංඝ රත්නය ලෝකයාට අනුත්තර වූ පුණ්‍ය ක්ෂේත්‍රය ය )* යනුවෙන් සංඝ රත්නය උදෙසා පූජා කිරීමෙන් නිවන සාක්ෂාත් කළ හැකි බව දේශනා කළ සේක. පින් කිරීමෙන් නිවන ලද නොහැකි නම් සංඝ රත්නය උදෙසා කළ පූජා භවගාමී

භාවයට පත්ව නිෂ්ඵල වනු ඇත. නමුත් එවැන්නක් ථෙරවාදයෙහි කොතැනකවත් සඳහන් කර නැත.

යම්කිසි කුසලයක් හෝ පිනක් කිරීමෙන් පසුව **"ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයා වහං හෝතු"** ( *මේ පින කෙලෙස් නැති කිරීම පිණිස වේවා* ) යන ප්‍රාර්ථනාව ථෙරවාදයට අනුකූල බව **"ඉදං මෙ පුඤ්ඤං නිබ්බානාධිගමාය පච්චයෝ හොතු"** ( *මේ පින නිවන අවබෝධ කිරීම පිණිස වේවා* ) යනුවෙන් සංයුත්ත නිකායයෙහි නිදානවග්ග ටීකාවෙහි පටිපදාසූත්‍ර වර්ණනාවෙහි සඳහන් වීමෙන් පැහැදිලි වේ. **"පුඤ්ඤං"** යන පදයට සමානව එම සූත්‍ර අටුවාවෙහි "කුසලය" යනුවෙන් සඳහන් කර තිබීමෙන් මේ පද දෙක ම සමාන යෙදුම් ඇති බව වැටහේ.

නොබෝ කලකින් සිදුවන ලොවට පහනක් වූ මහා සුගතයන් වහන්සේගේ වියෝව දරාගත නො හැකි වූ ආනන්ද මහ තෙරුන්ගේ සිත් තැවුල සංසිඳවීමට දේශනා කරන ලද කරුණා සිසිලෙන් පරිපූර්ණ වූ දීඝ නිකායෙහි මහා පරිනිබ්බාන සූත්‍රයෙහි සංග්‍රහ වන ශ්‍රී බුද්ධ වචනයෙන් ප්‍රමාණයක් මෙහි ලා මතක් කළ යුතු ය. **"කත පුඤ්ඤෝසි ත්වං ආනන්ද, පධානමනුයුඤ්ජ, ඛිප්පං හෝහිසි අනාසවෝ"** ( *ආනන්දය, තොප පින් කරන ලද්දෙහි, පධන් වීර්යය වඩනු, වහ වහා රහත් වන්නෙහිය* ). නිවන ලැබීමට අපහසු වූ ආනන්ද මහ තෙරුන් මෙම ශ්‍රී මුඛ දේශනාව සිහි කිරීමෙන් කල් නො යවා ම අර්හත්වයට පත් ව සියලු කෙලෙස් බරින් නිදහස් ව නිවී සැනසුන සේක. මහා කාරුණිකයන් වහන්සේගේ ශ්‍රී බුද්ධ වචනය ආශ්චර්යය, දෙව් මිනිසුන් කෙරෙහි අසහාය ශාස්තෘ භාවය ද ආශ්චර්යය. ආනන්ද මහ තෙරුන්ට දේශනා කරන ලද කරුණාබර

වදන් ආනන්ද මහ තෙරුන්ගේ පමණක් නොව මෙම ශාසනය පවතින තෙක් සියලු දෙව් මිනිසුන්ගේ සියලු ගිනි නිවීමට වැඩි තරම්. මහා කාරුණිකයන් වහන්සේගේ ශ්‍රී බුද්ධ වචනය වර්තමානයෙහි පවා සැදැහැතියන්ගේ මෝහ ගිනි නිවනු ඇත. අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේලා දහසක් ඉපදුන ද දැඩි මතධාරීන් නම් සසර ගමන අත් නොහරිනු ඇත. එය සංසාර දෝෂය යි. නුවණැත්තෝ එපිළිබඳ මැදහත් සිත් ඇත්තෝ වෙත්වා !

දීඝ නිකායෙහි චක්කවත්ති සූත්‍රයෙහි මෙසේ සංග්‍රහ වන්නේ ය **"කුසලානං භික්ඛවේ ධම්මානං සමාදාන හේතු ඒවමිදං පුඤ්ඤං පවඩ්ඪති"** (*කුසල් දහම් සමාදන් වීමෙන් භික්ෂූනි මෙවැනි පින් වැඩේ*). සතර සතිපට්ඨානය වැඩීමෙන් අර්හත් ඵලය දක්වා පුණ්‍ය ඵල ලැබෙන බව ද අග්‍ර වූ පුණ්‍ය ඵලය මාර බලය මැඩපවත්වන ආසවක්ඛය ඥානය බව ද  චක්කවත්ති සූත්‍රයෙන් පැහැදිලි වේ. කුසලය, ලෞකික සහ ලෝකෝත්තර යනුවෙන් දෙයාකාර බව එම සූත්‍ර අටුවාවෙහි " **තත්ථ දුවිධං කුසලං, වට්ටගාමී ච විවට්ටගාමී ච"** යන පාඨයෙන් ද සතර සතිපට්ඨානය වැඩීමෙන් සියලුම ලෞකික සහ ලෝකෝත්තර **පුණ්‍ය ඵල** ලැබෙන බව " **එවමිදං පුඤ්ඤන්ති, එවං ඉදං ලොකුත්තරපුඤ්ඤම්පි යාව ආසවක්ඛයා පවඩ්ඪතී** " යන පාඨයෙන් ද මැනවින් පැහැදිලි වේ.

ද්විපදෝත්තම වූ අසදෘශ ප්‍රතිවේධ චක්‍රයෙන් ද අතුල්‍ය වූ දේශනා චක්‍රයෙන් ද ප්‍රතිමණ්ඩිත වූ මෝහ නැමැති තිමිර පටල විධ්වංසනය කරන්නා වූ දශබලධාරීන් වහන්සේ ඇතුළු අග්‍ර ශ්‍රාවක අසූමහා ශ්‍රාවක ප්‍රකෘති ශ්‍රාවකයන් වහන්සේලාගේ ධරමාන කාලයෙහි පවා ඇතැමෙකුට **"පුණ්‍යය"**ට අනියත බියක් තිබූ නිසා දෝ **"මා භික්ඛවේ, පුඤ්ඤානං භායිත්ථ"** ( *භික්ෂූනි, පිනට බිය නොවව්* ) යනුවෙන්

සියලු සත්නට අමාමහ නිවන සාදාලන, භවය නොව නිවන ම වර්ණනා කරන්නා වූ සුගතයන් වහන්සේ විසින් අංගුත්තර සත්තක නිපාතයෙහි අබ්‍යාකතවග්ගයෙහි මා පුඤ්ඤභායි(මෙත්ත) සූත්‍රයෙහි භික්ෂූනට පවා පින නිර්දේශ කිරීමෙන් පැහැදිලි වේ.

බොහෝ දෙව් මිනිසුනට මංගල කරුණු පිළිබඳ ඇතිවූ ප්‍රශ්නයෙහි අමා මහ නිවන සාක්ෂාත් කිරීම පසුවට තබා කල්‍යාණ මිත්‍ර සේවනය ද දෙවනුවට තබා තමහට හිත සුව කැමැත්තාහට "අසේවනා ච බාලානං" යනුවෙන් පාප මිත්‍ර සේවනය ම පළමුව දුරු කළ යුතුය යන්න අවධාරණය කරන සේක් අනුපිළිවෙළින් මංගල කරුණු නිර්දේශ කරන්නා වූ තිලෝගුරු බුදුපියාණන් **"පුබ්බේ ච කත පුඤ්ඤතා"** යනුවෙන් ප්‍රකාශිත මංගල කරුණ ථෙර සමය නොඉක්මවා ථෙරවාදයට අනුකූලව විස්තර කරන්නා වූ අතිශය ගෞරවාර්හ බුද්ධඝෝෂ මහ තෙරපාණන් එම මංගල සූත්‍ර අටුවාවෙහි **"පුබ්බේ කත පුඤ්ඤතා නාම, අතීතජාතියං බුද්ධපච්චේකබුද්ධඛීණාසවේ ආරබ්භ උපචිත කුසලතා"** ( *පෙර කළ පින් ඇති බව යනු අතීත ජාතීන්හි බුදු පසේබුදු රහතන් වහන්සේලා අරමුණු කරමින් රැස් කරගන්නා ලද කුසල්*) ලෙස සඳහන් කරන සේක. "පින" සහ "කුසලය", එක ම අර්ථය දෙන අවස්ථානුකූල ව යොදන ලද සමානාර්ථ ඇති පද දෙකක් බව මෙහිදී ද සනාථ වේ.

දීඝ නිකායෙහි ලක්ඛණ සූත්‍ර ටීකාවෙහි **"මහාභිනීහාරතෝ පට්ඨාය හි මහාපුරිසෝ යං කිඤ්චි පුඤ්ඤං කරෝති සබ්බං තං සම්මාසම්බෝධිසමධිගමායේව පරිණාමෙති"** { *මහා අභිනීහාරයෙහි (ප්‍රථම නියත විවරණයෙහි) පටන් මහපුරුෂයාණන් වහන්සේ යම්කිසි පුණ්‍ය කර්මයක් කරත් ද ඒ සියල්ලම සම්මාසම්බුද්ධත්වය පිණිස ම යොමු කරත්* } යනුවෙන්ද අපදාන අට්ඨකථාවෙහි

සීහාසනියවග්ගයෙහි සීහාසනදායකතෙර අපදානයෙහි **"මයා නිබ්බානාධිගමාය ඒකං පුඤ්ඤං කාතුං වට්ටති"** ( *මවිසින් නිර්වාණය අධිගමනය පිණිස එක පිනක් කළ යුතු ය* ) යනුවෙන් ද සඳහන් වීමෙන් පෙර මහබෝසතාණන් වහන්සේලා ද චූලබෝසතාණන් වහන්සේලා ද පින් රැස්කළ බව දැනගත යුතු ය.

මෙවැනි උදාහරණ විශාල ප්‍රමාණයක් ත්‍රිපිටකයෙහි ඇතිමුත් සාධු ජනයන්ගේ හිත සුව පිණිස මෙපමණකුත් සෑහේ යැයි අපගේ හැඟීම ය. එනමුදු මෙකරුණ වැඩි දුර අධ්‍යයනයට උත්සුක වන සැදැහැතියනට අනුග්‍රහ පිණිස පහත එන ප්‍රමාණය ද සඳහන් කරම්හ.

උදාන අට්ඨකථාවසානයෙහි බදරතිත්ථවිහාරවාසී ආචරිය ධම්මපාල තෙරුන් සහ අනෙකුත් බොහෝ අට්ඨකථාචාරීන් වහන්සේලා විසින් කරන ලද ප්‍රාර්ථනා අනුව අතිශය ගෞරවාර්හ බුද්ධඝෝෂ මහ තෙරපාණන්ගේ කාලයට පසු ව පවා අටුවාටීකාචාරීන් වහන්සේලා ධර්ම දානය කිරීමෙන් පින් රැස්කළ බව ද එම පින් නිවනට යොමුකළ බව ද සනාථ වේ.

අභිධර්ම පිටකයෙහි ඇති "චිත්ත" යන පරමාර්ථය, 89 ක් වූ "විඤ්ඤාණ" වශයෙන් විස්තර වේ. මෙහි "චිත්ත" සහ "විඤ්ඤාණ" යන පද සමාන අරුත් ඇති බව පැහැදිලි ය. මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මාදී සත්වයනට "පින්" කර ගැනීමට ද "කුසල්" කර ගැනීමට ද අභිධර්මයෙහි ඇත්තේ කුසල් සිත් පමණි.

සූත්‍ර පිටකයෙහි භාවනා කර නිවන ලබා ගැනීමට ඇත්තේ ද "පින්" පමණි. **"තීණිමානි, භික්ඛවේ, පුඤ්ඤකිරියවත්ථූනි, කතමානි තීණි? දානමයං පුඤ්ඤකිරියවත්ථු සීලමයං පුඤ්ඤකිරියවත්ථු භාවනාමයං**

**පුඤ්ඤකිරියවත්ථු** " ( *භික්ෂූනි, පුණ්‍ය ක්‍රියා වස්තූන් තුනකි. කවර තුනක්ද ? දානමය පුණ්‍ය ක්‍රියාවස්තුවය සීලමය පුණ්‍යක්‍රියාවස්තුවය භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුවය* ) යනුවෙන් දීඝ නිකායෙහි සඞ්ගීති සූත්‍රයෙහි ද අංගුත්තර අට්ඨක නිපාතයෙහි දානවග්ගයෙහි පුඤ්ඤකිරියවත්ථු සූත්‍රයෙහි ද භාවනා කිරීම පවා පුණ්‍ය ක්‍රියාවක් බව විස්තර වේ.

මහානිද්දේසපාළි අටුවාවෙහි සුද්ධට්ඨකසුත්තනිද්දේසවණ්ණනාවෙහි එතැන යෙදෙන "පුඤ්ඤං" යන පදයට **"තෙධාතුකං කුසලාභිසඞ්ඛාරන්ති, කාමධාතුරූපධාතුඅරූපධාතූසු පටිසන්ධිදායක කෝසල්ලසම්භූතං පච්චයාභිසඞ්ඛාරං"** ( *ත්‍රෛධාතුක කුසලාභිසංඛාර යනු කාම රූප අරූප ලෝකයන්හි ප්‍රතිසන්ධිය ගෙන දෙන කෞශල්‍ය සහිත ප්‍රත්‍යය අභිසංඛාරය*) යන අටුවා පාඨය ඇතැමෙකුට මුලාවට පමණ බව ඔවුනගේ ප්‍රකාශ වලින් ප්‍රසිද්ධව ඇත. සූත්‍ර පිටකයෙහි බොහෝ තැන් පුද්ගලාධිෂ්ඨාන දේශනා බැවින් ( ඒ ඒ පුද්ගලයාට ගෝචර වන පරිදි දේශනා කරන ලද ධර්මයන්හි ) ඒ ඒ තැන්හි යෙදෙන පද පිළිබඳ සියලු අර්ථ එහි බහාලීම සුදුසු නොවනු ඇත. මෙතැන ද සියලු කුසල් හෝ සියලු පින් හෝ නො යෙදේ. පදයකට යෙදෙන සියලු ම අරුත් එකම තැනෙක සංග්‍රහ වන්නේ අභිධර්ම පිටකයෙහි ය. සූත්‍ර පිටකයෙහි නො වේ. මෙම ගාථාවෙහි පුණ්‍ය පදයට භවගාමී පුණ්‍යය පමණක් යෙදේ.

උදාහරණයක් ලෙස විමානවත්ථුපාළියෙහි ඡත්තමාණවක ගාථාහි සංගෘහිත ගාථා ඛණ්ඩයක් වන **"ධම්මමසඞ්ඛතමප්පටිකූලං"** හි **"ධම්ම"** යන පදයට නවලෝකෝත්තර ධර්මය හා පරියාප්තිය වශයෙන් දශ ප්‍රභේදයක් වූ සියලු ධර්මය නො යෙදෙන බවත්

එතැන්හි දී නවලෝකෝත්තර ධර්මයන්ගෙන් පරමාර්ථ ධර්ම වූ අසංඛත නිවන පමණක් යෙදෙන බවත් එම අටුවාවෙහි සඳහන් වේ.

අතිශය ගෞරවාර්හ උපසේනාචාර්ය හිමිපාණන් විසින් ලිඛිත මහානිද්දේසපාළි අටුවා පාඨය ඇතැමෙකුට වැරදි අදහස් ගෙන දුන්න ද ථෙරවාදයට අනුකූල ව ථෙරවාදය දීපනය කරමින් ලෝකයට හිත පිණිස තම අටුවා නිම කරමින් චූලනිද්දේසපාළි අටුවා අග තබන ලද ප්‍රාර්ථනාවෙහි පින සඳහා **"කුසල"** සහ **"පුඤ්ඤ"** යන දෙපදය භාවිත කිරීමෙන් ම අටුවාචාරීන් වහන්සේහට ද මෙම ගැටලුව නොතිබූ බව ධර්ම ගෞරව සහිතව පිළිගත යුතු ය.

අඞ්ගුත්තර තිකනිපාතයෙහි චූළවග්ගයෙහි සීලවන්ත සූත්‍ර අටුවාවෙහි **"පුඤ්ඤං පනෙත්ථ ලොකියලොකුත්තරමිස්සකං"** *( පුණ්‍යය යනු ලෞකික ලෝකෝත්තර මිශ්‍ර )* යනුවෙන් සඳහන් වන පාඨය එහි ටීකාවෙහි තවදුරට ත් **"භාවනාමයස්සපි පුඤ්ඤස්ස සඞ්ගණ්හනතො ලොකුත්තරස්සපි සම්භවො දට්ඨබ්බො"** *( භාවනාමය වශයෙන් පුණ්‍යය සංග්‍රහ වන විට ලෝකෝත්තර සම්භවය දැක්ක යුතු ය )* යනුවෙන් විස්තර වේ.

අඞ්ගුත්තර තිකනිපාතයෙහි ම බාලවග්ගයෙහි ඛත සූත්‍ර අටුවාවෙහි **"බහුඤ්ච පුඤ්ඤං පසවතීති එත්ථ ලොකියලොකුත්තරමිස්සකපුඤ්ඤං කථිතං"** ( *බොහෝ පින් ප්‍රසව කෙරේ යනු එහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රක පුණ්‍යය කථා කරන ලදී* ) යනුවෙන් සඳහන් වේ. මෙය ද පුණ්‍ය ය ලෞකික වශයෙන් ද ලෝකෝත්තර වශයෙන් ද අවස්ථානුකූල ව යෙදෙන බව වටහා ගැනීමට උපකාරක ය.

**"සබ්බං පනෙතං ලොකුත්තරභාවනාපුඤ්ඤවසප්පවත්තං මග්ගානුරූපඵලප්පවත්තියා චත්තාරො අරියපුග්ගලෙ අභිනිප්ඵාදෙති. එවං ලොකුත්තරකුසලං වෙදිතබ්බං. "** ( *එහි සියල්ල, ලෝකෝත්තර භාවනා පුණ්‍ය වශයෙන් පැවති මාර්ගානුරූප ව පැවැති ඵල වශයෙන් සතර ආර්ය පුද්ගලයෝ උපදිත්. එලෙස ලෝකෝත්තර කුසලය දැන ගත යුතු ය.*) යනුවෙන් අභිධම්මාවතාරයෙහි චිත්තනිද්දෙසයෙහි සඳහන් වීමෙන් "පුණ්‍ය" පදය ද "කුසල" පදය ද අවස්ථානුකූල ව ලෞකික සහ ලෝකෝත්තර වශයෙන් භාවිතා කරන ලද බව සනාථ වේ.

අභිධම්මාවතාර පුරාණටීකාවෙහි ෂට්ඨ ම පරිච්ඡේදයෙහි ආරම්මණවිභාගවර්ණනාවෙහි **"සෙක්ඛානං ඤාණසම්පයුත්තමහාකුසලස්ස, වොට්ඨබ්බනස්ස, පඤ්චමස්ස රූපකුසලස්ස ච තිවිධං ලොකුත්තරපුඤ්ඤං ආරම්මණං හොති. ඛීණාසවස්ස වොට්ඨබ්බනස්ස, ඤාණසම්පයුත්තමහාකිරියස්ස, පඤ්චමස්ස රූපකිරියස්ස ච අරහත්තපුඤ්ඤං ආරම්මණං හොති."** ( ශෛක්ෂයන්ගේ ඥානසම්ප්‍රයුක්ත මහා කුසලයට ද ව්‍යවස්ථාපනයට ද පස්වැනි රූප කුසලයට ද ත්‍රිවිධ වූ ලෝකෝත්තර පුණ්‍යය අරමුණු වේ. ක්ෂීණාශ්‍රවයාගේ ව්‍යවස්ථාපනයට ද ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියාවට ද පස්වැනි රූප ක්‍රියාවට ද අර්හත් පුණ්‍යය අරමුණු වේ.) යනුවෙන් සඳහන් කර තිබීම ධර්ම ගෞරව ඇති සත්පුරුෂයනට තම දෘෂ්ඨිය මනාව ඍජු කරගැනීමට පමණ බව අපගේ හැඟීම ය.

දීඝ නිකායෙහි මහා පරිනිබ්බාන සූත්‍රයෙහි මෙසේ සංගෘහිත ය. **"සියා බො පනානන්ද, තුම්හාකං එවමස්ස, අතීතසත්ථුකං පාවචනං, නත්ථි නො සත්ථා'ති. න බෝ පනෙතං, ආනන්ද, එවං දට්ඨබ්බං. යො වො ආනන්ද, මයා ධම්මෝ ච විනයෝ ච දේසිතෝ පඤ්ඤත්තෝ, සො**

**වො මමච්චයෙන සත්ථා"** ( *ආනන්දය, නුඹට මෙසේ සිතක් ඇතිවිය හැකිය, පෙළ දහම දේශනා කරන ලද අපගේ ශාස්තෲහු නැත'යැයි. ආනන්දය, එය එසේ නොදැක්ක යුතු ය. ආනන්දය, තොපට යම් ධර්මයක් විනයක් මවිසින් දේශනා කරන ලද ද පනවන ලද ද එම ධර්මය මගේ ඇවෑමෙන් තොපට ශාස්තෘ වේ.* )

මෙම ශ්‍රී මුඛ දේශනාව අනුව ත්‍රිපිටක ධර්මය පිළිගන්නා සැදැහැති බෞද්ධයාට තිලෝගුරු බුදුපියාණන් වහන්සේ ධර්ම රත්නය තුළ වර්තමානයෙහි ද වැඩ සිටින සේක. ශ්‍රද්ධාවන්ත බෞද්ධයාහට සැමකල්හි බුද්ධ රත්නයේ පිහිට ලැබෙනු ඇත. ධර්ම රත්නයේ පිහිට ලැබෙනු ඇත. සංඝ රත්නයේ පිහිට ලැබෙනු ඇත. ධර්මය නො පිළිගන්නා සැමකල්හි ම අනාථ ය.

ඛුද්දක නිකායෙහි ඛුද්දක පාඨයෙහි නිධිකණ්ඩ සූත්‍රයෙහි මෙසේ සංග්‍රහ වෙයි. **"කයිරාථ ධීරො පුඤ්ඤානි, යො නිධි අනුගාමිකො"** ( *යම් නිධානයක් තමන් පසුපස එන්නේ ද, නුවණැත්තෝ එම පින් කරත්* ). **"පටිසම්භිදා විමොක්ඛා ච යා ච සාවක පාරමී, පච්චේකබෝධි බුද්ධභූමි, සබ්බමෙතෙන ලබ්භති, ඒවං මහත්ථිකා ඒසා යදිදං පුඤ්ඤසම්පදා, තස්මා ධීරා පසංසන්ති, පණ්ඩිතා කතපුඤ්ඤතා"** (*සිව් පිළිසිඹියාවන් ද විමෝක්ෂයන් ද යම්තාක් ශ්‍රාවක පාරමිතාවන් ද පසේබුද්ධත්වය ද සම්මාසම්බුද්ධත්වය ද මේ සියල්ල ම ලබා දෙයි, යම් පුණ්‍ය සම්පදාවක් ඇත් ද එය මෙසා මහා අර්ථදායක ය, රැස් කරගන්නා ලද පින් ඇති පණ්ඩිතයෝ නුවණැත්තන් විසින් ප්‍රශංසා කරනු ලැබෙත්*).

සැදැහැතියෝ අවධි වෙත්වා ! අංගුත්තර පඤ්චක නිපාතයෙහි අනුග්ගහිත සූත්‍රයෙහි නිර්දේශිත පරිදි භාවනානුයෝගීහු කලින් කල

තම මුල් පිරිසිදු කර ගැනීමෙන් සම්මාදිට්ඨිය දියුණු කර ගැනීමෙන් උත්තම වූ විදර්ශනා ඥානයන් සාක්ෂාත් කර ගනිත්වා!

දුර්මතය නිර්වේඨනය කරන ලදී.

ථෙරවාදය උද්දීපනය කරන ලදී.

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ

ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද

මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2008.12.04

# ප්‍රාර්ථනා කිරීම

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ මහා පුණ්‍ය සම්භාරයෙන්, කෙටි ම කාලයකින්, පහසුම ආකාරයෙන්, සුඛ ප්‍රතිපදාවෙන්, සියලු දුකින් මිදෙම්වා ! මේ සියලු කෙලෙස් බරින් නිදහස් වෙම්වා ! අජර වූ අමර වූ නිවන ලැබ සැනසෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

මේ මොහොතෙහි පටන් නිවන් දක්නා මොහොත දක්වා සැම කල්හි, සම්මා දිට්ඨික වන්නෙම්වා ! ත්‍රිහේතුක වන්නෙම්වා ! සීල සම්පන්න වන්නෙම්වා ! පහසුවෙන් සිල් රකින්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා ! නිදුක් වන්නෙම්වා ! නිරෝගී වන්නෙම්වා ! බාලයන්ගේ ඇසුර නො ලබන්නෙම්වා ! බාලයන්ගෙන් අල්පමාත්‍ර හෝ බලපෑමකට ලක් නො වන්නෙක් වෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ට හෝ සත්පුරුෂයන්ට එරෙහිව සිතුවිලි මාත්‍රයක්වත් නූපදවන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර ලබන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ විශේෂ අනුකම්පාව ලබන්නෙම්වා !

සද්ධා සම්පන්න වන්නෙම්වා ! සති සම්පන්න වන්නෙම්වා ! වීර්ය සම්පන්න වන්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා !

නිර්මල පර්යාප්තිය අසන්නෙම්වා ! ධරන්නෙම්වා ! වචනයෙන් පුරුදු පුහුණු වන්නෙම්වා ! අර්ථ පිරික්සන්නෙම්වා ! නුවණින් විනිවිද දකින්නෙම්වා ! නිවැරදිව අන්‍යයන්ට දේශනා කරන්නෙම්වා !

නිදුකින් සමථය වඩන්නෙම්වා ! නිදුකින් විදර්ශනා වඩන්නෙම්වා ! කැමති කැමති තාක් සමාපත්තීන්ට කැමති කැමති තාක් කාලයක් සමවදින්නෙම්වා !

කැමති කැමති තාක් දේ නිදුකින් ලබන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙන්නෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

www.aathaapi.org
The Wheel of Dhamma is rotating

Free Distribution - ධර්ම දානයක් ලෙස නොමිළයේ බෙදාහැරීම පිණිසයි